# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2018 අංක 32 දරන වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 2018 ඔක්තෝබර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 ඔක්තෝබර් මස 05 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 28.00 **තැපැල් ගාස්තුව :** රු. 35.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2018 අංක 32 දරන වැව්ලි කලාපය සඳහා වූ
නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2018 ඔක්තෝබර් මස 04 වන දින]

එල්.ඩී. — ඕ. 52/2016

**ශ්‍රී ලංකාවේ වැව්ලි කලාපයේ නව ගම්මාන සංවර්ධනය උදෙසා වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2018 අංක 32 දරන වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

I වන කොටස

**වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිහිටුවීම**

2. (1) (මෙම පනතෙහි "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එම නාමයෙන් එය විසින් සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

3. අමාත්‍යවරයා විසින්, අදාළ අමාත්‍යවරුන්ගේ එකඟතාවය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නම් කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි වැව්ලි කලාපය තුළ වූ ප්‍රදේශවල, මෙම පනත යටතේ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය සඳහා අධිකාරිය වගකිව යුතු ය. අධිකාරියේ නම් කළ ප්‍රදේශ.

අධිකාරියේ අරමුණු.

4. අධිකාරියේ අරමුණු -

(අ) වැව්ලි කලාපයේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් නම් කළ ප්‍රදේශවල වැව්ලි ප්‍රජාව ප්‍රධාන සමාජ ධාරාවට ඇතුළත් කිරීම සහතික කිරීම; සහ

(ආ) නම් කළ ප්‍රදේශවල වැව්ලි ප්‍රජාව, ඔවුනට ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි වන පරිදි සමාජමය හා ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම,

විය යුතු ය.

අධිකාරියේ බලතල.

5. අධිකාරිය විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා, වෙනත් යම් ලිඛිත නීතියක ඇති විධිවිධානවලට යටත් ව, පහත සඳහන් බලතල සියල්ල හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය:-

(අ) අධිකාරිය විසින්, මෙම පනත යටතේ වූ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ කිරීමට හැකි වනු පිණිස රජයේ යම් දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් යම් පෞද්ගලික හෝ රාජ්‍ය ආයතනයක් ඇතුළු යම් තැනැත්තකු සමඟ කොන්ත්‍රාත්තුවලට හෝ ගිවිසුම්වලට හෝ ඇතුළත් වීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ලැබෙන මුල්‍යමය හෝ අන්‍යාකාරයක ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීම හා ඒවා මෙම පනත යටතේ වූ අධිකාරියෙහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා යෙදවීම:

එසේ වුව ද, මෙම පනතෙහි වෙනත් යම් විධිවිධානයක පටහැනිව කවරක් තිබුණ ද, අධිකාරිය විසින් සියලුම විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග වෙනුවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය;

(ඈ) අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් රාජ්‍ය බැංකුවක හෝ රාජ්‍ය මූල්‍ය ආයතනයක ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම;

(ඇ) අධිකාරිය විසින් සුදුසු යයි සිතන ආකාරයට, අධිකාරියේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන අරමුදල් රාජ්‍ය බැංකුවල හා රජයේ මූල්‍ය ආයතනවල ආයෝජනය කිරීම;

(ඉ) අධිකාරියේ කාර්ය සඳහා යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම හා දැරීම හෝ අධිකාරිය විසින් මිල දී ගත් හෝ දරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් බදු දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ වෙනත් යම් ආකාරයකින් බැහැර කිරීම; සහ

(ඊ) නම් කරන ලද ප්‍රදේශවලින් බැහැරව කාර්යාලයක්, ශාඛා කාර්යාලයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම සහ පනත යටතේ වන කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය විය හැකි යම් කාර්යයක් එම නම් කරන ලද ප්‍රදේශවලින් බැහැරව ක්‍රියාත්මක කිරීම.

**6.** අධිකාරියේ කර්තව්‍ය - අධිකාරියේ කර්තව්‍ය.

(අ) අමාත්‍යවරයා විමසා, නම් කළ ප්‍රදේශවල නව ගම්මාන සංවර්ධනය කිරීම සඳහා ආණ්ඩුවේ සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම;

(ආ) අධිකාරියේ අරමුණු ඉටුකරගැනීම උදෙසා ක්‍රියා කිරීමේ දී වැව්ලි කලාපයේ අනෙකුත් ජාතික, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම;

(ඇ) නව ගම්මාන සංවර්ධනය සඳහා වූ ආණ්ඩුවේ සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සැදීමේ දී සහ නම් කළ ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමේ දී වැව්ලි කලාපයේ ප්‍රජාමූල සංවිධානවල සහභාගිත්වය සහතික කිරීම;

(ඈ) නම් කළ ප්‍රදේශවල වතුවල ඇති නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාසවල අයිතිය ප්‍රදානය කිරීම සඳහා, එම පදිංචිකරුවන්ට හිමිකම් ඔප්පු නිකුත් කිරීම පහසු කරලීම;

(ඉ) නම් කළ ප්‍රදේශවල වතු අංශයේ සිටින තරුණ ප්‍රජාවට ඔවුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා තෘතීයික හා උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම සඳහා සහාය සැලසීම;

(ඊ) නම් කළ ප්‍රදේශවල ප්‍රජාවට අත්‍යවශ්‍ය සේවා සැපයීම පහසු කරලීම සඳහා පළාත් සභා අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශවල ප්‍රාදේශීය මට්ටමේ කාර්යාල සමඟ කටයුතු කිරීම;

(උ) නම් කළ ප්‍රදේශවල වතු ප්‍රජාව සඳහා විකල්ප ජීවනෝපාය අවස්ථා ප්‍රවර්ධනය කිරීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය මග පෙන්වීම හා යෙදවුම් සැපයීම;

(ඌ) තම ජීවනෝපාය මාර්ග නගා සිටුවීම සඳහා කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් හා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් ද ඇතුළු වතු අංශයේ විවිධ ප්‍රජා කණ්ඩායම් සවි බල ගැන්වීම;

(එ) නම් කළ ප්‍රදේශවල වතුවල පිහිටි නිවාසවල නීත්‍යනුකූල පදිංචිකරුවන්ගෙන් පැවතෙන්නන්ට ද එම නීත්‍යනුකූල පදිංචිකරුවන් විසින් භුක්ති විඳිනු ලබන සියලු පහසුකම් සලසනු ලබන බවට තහවුරු කිරීම;

(ඒ) නම් කළ ප්‍රදේශවල භූමි සහ ජල මූලාශ්‍රවල භෞතික පහත වැටීම් අවම කිරීමේ සහ පරිසර දූෂණය තුරන් කිරීමේ ද අරමුණින් නිවාරක සහ ප්‍රතිකර්මීය යන දෙයාකාරයෙන්ම වූ සංරක්ෂණ පියවර සියලු මට්ටම්වල දී ශක්තිමත් කිරීම;

(ඔ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය විමසා, නම් කළ ප්‍රදේශවල උවදුරු සහිත ප්‍රදේශ හඳුනාගැනීම සහ නේවාසික කාර්ය සඳහා නීති විරෝධී ලෙස පදිංචිවීම්වලින් ආරක්ෂා කරගනිමින් ඒවා විකල්ප ඵලදායී භාවිතයට හැරවීම; සහ

(ඕ) නම් කළ ප්‍රදේශවල ප්‍රමාණවත් සමාජ සේවා සහ ප්‍රමාණවත් තිරසාර යටිතල පහසුකම් සැලසීම ප්‍රවර්ධනය කිරීම,

විය යුතු ය.

## II වන කොටස

### අධිකාරියේ කළමනාකරණය හා පරිපාලනය

අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය.

**7.** අධිකාරියේ කටයුතු පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් කළමනාකරණය සහ පරිපාලනය කළ යුත්තේ ය:-

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හත්දෙනෙක්; එනම් -

(i) කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(ii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(iii) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(iv) පොදු ව්‍යවසාය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(v) පළාත් සභා සහ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(vi) නිවාස හා ඉදිකිරීම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(vii) ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නිලධරයකු;

(ආ) යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රජා සංවර්ධනය, මූල්‍ය හා පළාත් පරිපාලනය යන අංශයන් හි ප්‍රවීණතාවක් දක්වන පුද්ගලයන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මින් මතු "පත් කළ සාමාජිකයන්" ලෙස සඳහන් කරනු ලබන) සාමාජිකයන් හයදෙනකු; මින් එක් සාමාජිකයකු වැවිලි සමාගම් නියෝජනය කිරීම සඳහා ලංකා වැවිලිකරුවන්ගේ සංගමයෙන් පත් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා.

**8.** (1) අමාත්‍යවරයා විසින්, පත් කළ සාමාජිකයන් අතරින් -

(අ) එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ද; සහ

(ආ) එක් සාමාජිකයකු මණ්ඩලයේ උපසභාපතිවරයා ලෙස ද,

පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා සහ උපසභාපතිවරයා අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, 7 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(3) සභාපතිවරයා හෝ උපසභාපතිවරයා විසින් අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව තම ධුරයේ කාර්යයන්ට බැහැරව වෙනත් කිසිදු ගෙවීම් සහිත සේවා නියුක්තියක නියැළීම නොකළ යුතු ය.

(4) අමාත්‍යවරයා අමතනු ලබන ලිපියක් මඟින් සභාපතිවරයාට හෝ උපසභාපතිවරයාට තම ධුරයෙන් කවර හෝ වේලාවක ඉල්ලා අස්වීමට හැකියාව ඇති අතර අමාත්‍යවරයා එම ලිපිය පිළිගනු ලැබූ දින සිට එම ඉල්ලා අස්වීම බලපැවැත්විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයා හෝ උපසභාපතිවරයා අදාළ ධුරවලින් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) රෝගාතුරවීම, වෙනත් දුබලතාවක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයාට තම ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් සභාපතිවරයා ලෙස කටයුතු කිරීම සඳහා උපසභාපතිවරයා පත් කරනු ලැබිය හැකි ය.

(7) රෝගාතුරවීම, වෙනත් දුබලතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනාටම සිය ධුරවල කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, වෙනත් පත් කළ සාමාජිකයකු, ඒ සාමාජිකයාගේ පත් කළ සාමාජිකයකු වශයෙන් වන සාමාන්‍ය කාර්යවලට අමතරව, සභාපතිවරයා ලෙස කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

(8) මියයාම, ධුරයෙන් ඉවත් කරනු ලැබීම හෝ ධුරය දරන්නා විසින් එම ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ හේතුවෙන් සභාපතිවරයාගේ හෝ උපසභාපතිවරයාගේ ධුරය හිස් වූ අවස්ථාවක දී අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ පත් කිරීමක් කරනු ලබන තෙක් මණ්ඩලයේ සාමාජිකයකු එම ධුරයේ කාර්ය ඉටුකිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ මූල්‍යමය සම්බන්ධතාව.

**9.** (1) අමාත්‍යවරයා විසින් යම් තැනැත්තකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට පෙර, එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කර්තව්‍ය ඉටුකිරීම කෙරෙහි අගතිදායක ලෙස බලපෑමට ඉඩ ප්‍රස්ථා ඇති මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් අධිකාරියේ කටයුතු කෙරෙහි ඒ තැනැත්තාට නැති බවට සෑහීමට පත් විය යුතු ය.

(2) තව ද, මණ්ඩලයට පත් කරනු ලැබ ඇති කවර හෝ සාමාජිකයකු එසේ පත් කරන ලද දින සිට එවැනි සම්බන්ධතාවක් අත්කර ගෙන නොමැති බවට අමාත්‍යවරයා විසින් කලින් කල සෑහීමට පත් වනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය විසින් සාදන ලද හෝ සෑදීම සඳහා යෝජනා කරනු ලබන කවර ආකාරයක හෝ ගිවිසුමකට සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවක් ඇති මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් එම සම්බන්ධතාවයේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී හෙළි කළ යුතු ය. තව ද, එවැනි හෙළිදරව් කිරීමක් අධිකාරියේ වාර්තාවල සටහන් කළ යුතු වන අතර එම ගිවිසුම සම්බන්ධව අධිකාරිය විසින් කරනු ලබන කවර හෝ සලකා බැලීම් හෝ තීරණය කිරීම්වලට එම සාමාජිකයා සහභාගී නොවිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා මණ්ඩලයේ සාමාජිකයකු යන්නට මණ්ඩලයේ සභාපතිවරයා, උපසභාපතිවරයා, නිල බලයෙන් පත් වූ සාමාජිකයකු හා පත් කළ සාමාජිකයකු ඇතුළත් වේ.

මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්වීමට නුසුදුසුකම්.

**10.** යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වන්නේ නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම අවසන්ව ඇත්නම්;

(ඇ) අධිකාරිය විසින් හෝ වෙනුවෙන් සාදන ලද යම් ගිවිසුමක් යටතේ සෘජුව හෝ වක්‍රව යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් දරයි නම් හෝ භුක්ති විඳී නම්;

(ඈ) මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සිය කර්තව්‍ය ඉටුකිරීමේ දී අගතිදායී ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත්තේ නම්;

(ඉ) මණ්ඩලයේ පූර්ව අනුමතියක් ලබාගැනීමෙන් තොරව මණ්ඩලයේ අඛණ්ඩ රැස්වීම් තුනකට නොපැමිණ සිට ඇත්නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට සොයාගනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(උ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත් වූවකු හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශ කරනු ලැබ නිදහස් නොකරන ලද තැනැත්තකු නම්; හෝ

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද සිරදඬුවමක් විඳිමින් සිටී නම් හෝ එසේ සිර දඬුවමක් විඳීමට නියම වී ඇත්නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමට හෝ එවැනි සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

පත්කළ සාමාජිකයන්ට අදාළ විධිවිධාන.

11. (1) මණ්ඩලයේ සෑම පත්කළ සාමාජිකයකු ම මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතුවෙන් කලින් ධුරය හිස් කළ හොත් මිස, සිය ධුරය වසර තුනක කාලයක් දැරිය යුතු අතර, විනය හේතු මත ඉවත් කළ හොත් මිස නැවත පත්කරනු ලැබීම සඳහා සුදුසු විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම කළ හැකි ය.

(3) අමාත්‍යවරයා අමතනු ලබන ලිපියක් මගින් යම් පත්කළ සාමාජිකයකුට තම ධුරයෙන් කවර හෝ වේලාවක ඉල්ලා අස්වීමට හැකි අතර, අමාත්‍යවරයා විසින් එම ලිපිය පිළිගනු ලැබීමේ දී එම ඉල්ලා අස්වීම බලපැවැත්විය යුතු ය.

(4) (අ) යම් පත්කළ සාමාජිකයකුගේ මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම සිදු වූ විටක අමාත්‍යවරයා විසින් එම පත්කළ සාමාජිකයාගේ පත්වීමට අදාළව මෙම පනතේ ඇති විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) අමාත්‍යවරයා විසින් (අ) ඡේදයේ කාර්ය සඳහා සාමාජිකයකු පත්කිරීම එම පුරප්පාඩුව ඇති වී මසක් ඇතුළත කළ යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයා ඔහු විසින් අනුප්‍රාප්ත කරනු ලබන සාමාජිකයාගේ ධුර කාලයෙහි අවසන් නොවූ කාලපරිච්ඡේදය සඳහා එම ධුරය දැරිය යුතු ය.

(5) යම් පත්කළ සාමාජිකයකුට රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සිය ධුරයෙහි කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන විටක, අමාත්‍යවරයා විසින් 7 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) මෙහි ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, යම් පත්කළ සාමාජිකයකුට (1) වන උපවගන්තියේ සඳහන් වසර තුනක කාලය ඉකුත් වීමෙන් පසුව වුව ද, අමාත්‍යවරයා විසින් ඔහු නැවත පත්කරනු ලබන තෙක් හෝ ඔහු වෙනුවට අලුත් සාමාජිකයකු පත්කරනු ලබන තෙක් දිගටම ධුරය දරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ රැස්වීම්.

**12.** (1) සභාපතිවරයා විසින්, ඔහු පැමිණ සිටී නම්, මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා නොපැමිණි විටක දී උපසභාපතිවරයා එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනාම යම් රැස්වීමකට නොපැමිණි විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් එම රැස්වීම සඳහා ඔවුන් අතරින් සභාපතිවරයකු තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු සෑම කාරණයක් පිළිබඳව ම මණ්ඩලයේ රැස්වීමක දී කටයුතු කරනු ලැබිය යුතු අතර, රැස්වීමට පැමිණ ඡන්දය දෙන්නා වූ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් නිශ්චය කළ යුතු ය.

(3) රැස්වීමක දී සලකා බලනු ලබන යම් ප්‍රශ්නයක් මත සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබුණු විටක දී එම රැස්වීමේ සභාපතිවරයාට තම මුල් ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මණ්ඩලය විසින් ගනු ලබන සෑම තීරණයක් ම හේතු මඟින් තහවුරු කළ යුතු අතර, ලිඛිතව විය යුතු ය; තව ද, අධිකාරියේ මුද්‍රාව එයට යොදනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ යම් සාමාජිකයකුට සභාපතිවරයා වෙත ලිඛිත දැන්වීමක් ඉදිරිපත් කරමින් රැස්වීමක් කැඳවීම සඳහා ඉල්ලීමක් කළ හැකි අතර, සාධාරණ හේතු මත මිස සභාපතිවරයා විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(6) 16 වන වගන්තිය යටතේ පත් කරනු ලබන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලයේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීමක යම් දෝෂයක් පැවතීම හෝ යන හේතු නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ ක්‍රියා පටිපාටියක් අවලංගු කළ යුතු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(8) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(9) මෙම වගන්තියේ පෙරාතුවම වූ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳව මණ්ඩලය විසින් තම කටයුතු විධිමත් කරනු ලැබිය හැකි ය.

13. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය. අධිකාරියේ මුද්‍රාව.

(2) අධිකාරියේ මුද්‍රාව -

(අ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ තැනැත්තා හෝ තැනැත්තන් භාරයේ තිබිය යුතු ය;

(ඇ) මණ්ඩලයේ අවසරය නොමැතිව සහ තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(3) අධිකාරියේ මුද්‍රාව තබන ලද ලේඛනවල රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

14. (1) මණ්ඩලයේ කර්තව්‍ය ඵලදායීව ඉටු කිරීමේ කාර්ය සඳහා අදළ විෂය කාරණා පිළිබඳව අදහස් ලබාගැනීම පිණිස අදාළ යම් විෂයයක් පිළිබඳ විශේෂඥයන් මණ්ඩලයේ රැස්වීම්වලට කැඳවීමට මණ්ඩලයට හැකි ය. මණ්ඩලයේ රැස්වීම්වලට විශේෂඥයන් කැඳවීම.

(2) විශේෂඥයන්ගේ අදහස් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා මණ්ඩලයට පූර්ණ අභිමතය තිබිය යුතු ය.

(3) විශේෂඥයන්ට, ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොතිබිය යුතු ය.

15. අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලබන පරිදි වූ පාරිශ්‍රමික මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් මණ්ඩලයේ සාමාජිකයන්ට හා විශේෂඥයන්ට ගෙවනු ලැබිය හැකි ය. මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් පාරිශ්‍රමික.

III වන කොටස

**අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම**

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**16.** (1) අමාත්‍යවරයා විසින් අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" ලෙස සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු මණ්ඩලයේ නිර්දේශය මත පත්කරනු ලැබිය යුතු අතර, එම අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, මණ්ඩලයේ පොදු හෝ විශේෂ විධානවලට හා අධීක්ෂණයට යටත්ව -

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය හා පාලනය ඇතුළුව අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම භාරව කටයුතු කළ යුතු ය;

(ආ) මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය;

(ඇ) මණ්ඩලය විසින් ඔහුට පවරනු ලබන සියලු කර්තව්‍ය ඉටු කළ යුතු ය; සහ

(ඈ) මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් මෙන්ම අධිකාරියේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා වශයෙන් ද ක්‍රියා කළ යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයාට මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණීමට ද, කථා කිරීමට ද හිමිකම ඇති නමුත්, එවැනි රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම නොතිබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලයේ ලිඛිත අනුමතිය ඇතිව තම බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් අධිකාරියේ යම් නිලධරයකුට ලිඛිතව පවරා දීම, එසේ කිරීම අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන කවර හෝ විටක දී කළ හැකි අතර, එම නිලධරයා විසින් එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පොදු හෝ විශේෂ විධාන යටතේ ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම හෝ කිරීම කළ යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා -

(අ) සිය කාර්ය ඉටු කිරීමෙහිලා ස්ථිර ලෙස නොහැකියාවට පත්වුවහොත්; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව, වංචනික හෝ නීති විරෝධී ස්වභාවයෙන් වූ හෝ අධිකාරියේ යහපතට අගතිදායී වන්නා වූ යම් ක්‍රියාවක් සිදු කර ඇත්නම්; හෝ

(ඇ) අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් විධාන පිළිපැදීමට අපොහොසත්ව ඇත්නම්,

අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා ඔහුගේ ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුර කාලය පත්වීමේ දින සිට වසර තුනක් විය යුතු අතර, (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කළහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය, එම ධුරය දරන්නා මිය යාම, (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ ඔහු විසින් අමාත්‍යවරයාට යවන ලිපියක් මඟින් ඉල්ලා අස්වීම හෝ මත හිස් වන්නේ ය.

(8) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් කරනු ලබන තෙක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරයේ කටයුතු කිරීම සඳහා මණ්ඩලයේ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

**17.** (1) අධිකාරිය විසින්, අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ නිලධරයන් හා අනෙකුත් සේවා නියුක්තයන් සංඛ්‍යාවක් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය. අධිකාරියේ කාර්ය මණ්ඩලය.

(2) අධිකාරිය විසින්, (1) වන උපවගන්තිය යටතේ අධිකාරියට පත් කරනු ලබන නිලධරයන් හා සේවා නියුක්තයන් සම්බන්ධයෙන්-

(අ) එම නිලධරයන්ගේ හා සේවා නියුක්තයන්ගේ සේවා නියුක්තියෙහි නියම හා කොන්දේසි නිශ්චය කිරීම;

(ආ) රජයේ අදාළ නියමු උපදෙස් හා අනුකූල වෙමින් එම නිලධරයන්ගේ හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික ගෙවිය යුතු අනුපාතිකයන් නියම කිරීම;

(ඇ) විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ එම නිලධරයන් හා සේවා නියුක්තයන් සේවයෙන් පහකිරීම; සහ

(ඈ) එම නිලධරයන්ගේ හා සේවා නියුක්තයන්ගේ ප්‍රතිලාභය සඳහා සුබසාධක හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිහිටුවීම හා ඒ සඳහා දායකත්වය ලබා දීම,

කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් යම් කාරණයක් හෝ සියලු කාරණා හෝ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(4) කෙසේ වුව ද, අධිකාරිය විසින්, පෞද්ගලික හෝ රාජ්‍ය අංශයේ දරන ලද යම් තනතුරකින් පහකරන ලද තැනැත්තකු අධිකාරියේ නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු හෝ ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**18.** (1) අධිකාරියේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එකී නිලධරයාගේ සහ එකී නිලධරයා සේවයේ නියුක්තව සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව

එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇත්තා වූ ද, එමගින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇත්තා වූ ද, යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් අධිකාරියට කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ වගකීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සංස්ථාවල නිලධරයන් සහ අනෙකුත් සේවා නියුක්තයන් පත් කිරීම.

**19.** (1) අධිකාරියේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු එම නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලන මණ්ඩලයේ කැමැත්ත මත අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවකට විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව අධිකාරිය සහ එම සංස්ථාවේ පාලන මණ්ඩලය විසින් එකඟ වනු ලැබිය හැකි පරිදි වූ නියම සහ කොන්දේසි මත අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ තැනැත්තා, අධිකාරියේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු මෙන් අධිකාරියේ විනය පාලනයට යටත් විය යුතු ය.

(3) මෙම වගන්තියේ කාර්යය සඳහා රාජ්‍ය සංස්ථාවකට අදාළව "පාලන මණ්ඩලය" යන්නෙන්, ඒ රාජ්‍ය සංස්ථාවේ පරිපාලනය හා කළමනාකරණය පැවරී ඇති එහි අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වෙනත් මණ්ඩලයක් අදහස් වේ.

IV වන කොටස

**මූල්‍ය**

අධිකාරියේ අරමුදල.

**20.** (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුත්තේ ය.

(2) අරමුදලට -

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ;

(ආ) අධිකාරිය විසින්, මෙම පනත යටතේ තම බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණ;

(ඇ) අධිකාරිය වෙත කවර හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් ප්‍රමාණ;

(ඈ) අධිකාරිය සතු දේපළ අන්සතු කිරීම, බදු දීම හෝ කුලියට දීම මඟින් ලැබෙන සියලු මුදල් ප්‍රමාණ,

ගෙවනු ලැබිය යුත්තේ ය.

(3) මෙම පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණ අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුත්තේ ය.

අධිකාරිය විසින් ගිණුම් පවත්වාගෙන යාම.

**21.** අධිකාරිය විසින් එයට සුදුසු යයි හැඟෙන පරිදි යම් බැංකුවක යම් ගිණුමක් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සිදු කළ හැකි අතර එම ගිණුම රාජ්‍ය සංස්ථාවල මූල්‍ය ගනුදෙනුවලට අදාළව පවතින රජයේ මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**22.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) අධිකාරිය විසින් එහි ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියලු මූල්‍ය ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(3) අධිකාරියේ මූල්‍ය කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව අධිකාරියේ ගිණුම් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(4) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය සඳහා අදාළ විය යුතු ය.

**23.** අධිකාරියට අයත් මුදල්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව හා මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ආණ්ඩුවේ අනුමතිය ලද සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය හැකි ය. අරමුදල් ආයෝජනය.

**24.** (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ හා මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ ලිඛිත එකඟත්වය මත සහ යම් දෙන ලද සාමාන්‍ය අධිකාරයක නියමයන්ට අනුකූලව, අධිකාරියට එහි බැඳීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණ ණයට ගැනීම හෝ ණය වශයෙන් ලබා ගැනීම හෝ කළ හැකි ය. ණය ලබා ගැනීම සඳහා අධිකාරියට ඇති බලතල.

(2) මෙම වගන්තිය යටතේ අධිකාරිය විසින් ලබා ගනු ලබන කවර හෝ ණයක් සම්බන්ධව පවත්නා හිඟ මුදල් ප්‍රමාණවල එකතුව කවර හෝ විටක දී අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

**25.** අධිකාරිය, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි කොන්දේසි ප්‍රකාර අවසර දී ඇති ප්‍රමාණයට අධිකාරියේ ආදායම් හෝ ලාභ මත යම් බදු ගෙවීම් කිරීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. තීරුබදු ආදිය ගෙවීමෙන් අධිකාරිය නිදහස් කිරීම.

V වන කොටස

**පොදු විධිවිධාන**

**26.** (1) අධිකාරිය විසින් සෑම මූල්‍ය වර්ෂයක් ම අවසාන වීමෙන් සය මසක් ඇතුළත එම මූල්‍ය වර්ෂය තුළ අධිකාරිය විසින් කරගෙන යන ලද ක්‍රියාකාරකම්වල වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාරදිය යුතු අතර, එම වර්ෂයට අදාළ පහත සෑම ලියකියවිල්ලක ම වාර්ෂික වාර්තාව.

පිටපතක් බැගින් ද එම වාර්තාවට ඇමිණීමට සැලැස්විය යුතු ය. එනම්-

(අ) විගණකාධිපතිගේ වාර්තාව සමග වර්ෂය සඳහා අධිකාරියේ විගණනය කළ ගිණුම්; සහ

(ආ) එම වාර්තාව හා ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම වූ වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම්වල වාර්තාවක්.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙනු ලැබූ වාර්තාවේ හා අනෙකුත් ලියකියවිලිවල පිටපත් අමාත්‍යවරයා විසින් එම වාර්තාව ලැබුණු දින සිට සය මසක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය.

**27.** මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම සහ අධිකාරියේ සෑම නිලධරයකුම හා අනෙකුත් සේවා නියුක්තයකුම තම කාර්ය ආරම්භ කිරීමට පෙර මෙම පනත යටතේ තම බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන අධිකාරියේ කටයුතු හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් තමා දැඩි රහස්‍යභාවයක් ආරක්ෂා කරන බවට ඇප වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු වන අතර, එවැනි ප්‍රකාශයක් මඟින් තමන් විසින් පහත අවස්ථාවල දී හැර වෙනත් කිසිදු අවස්ථාවක දී එවැනි යම් කාරණා හෙළි නොකරන බවට ද ඇප විය යුතු ය; එනම් -

(අ) නීත්‍යානුකූල අධිකරණයක් විසින් එසේ කිරීමට නියම කරනු ලැබූ විට; හෝ

(ආ) යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට නියම කරනු ලැබූ විට.

අධිකාරියේ බලතල පැවරීම.

**28.** (1) මණ්ඩලය විසින් ලිඛිතව හා එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව අධිකාරියේ යම් බලතල හෝ කර්තව්‍ය අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ එහි යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි වන අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ එම නිලධරයා විසින් අධිකාරිය නමින් හා අධිකාරිය වෙනුවෙන් එම බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් පැවරීමක් නොතකා එසේ පවරන ලද යම් බලතලයක් හෝ කර්තව්‍යයක් එය විසින් ම ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි වන අතර, ඕනෑම අවස්ථාවක එම පවරා දීම අවලංගු කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා විසින් කරනු ලබන විධාන.

**29.** (1) අධිකාරියේ අරමුණුවලට අදාළ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිසි පරිදි බලගැන්වීම සහතික කළ හැකි වන පරිදි අධිකාරියේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත ලිඛිතව පොදු හෝ විශේෂ විධාන නිකුත් කළ හැකි ය. එවැනි විධාන ක්‍රියාවට නැංවීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, අධිකාරියේ කටයුතුවලට අදාළ වාර වාර්තා, ගිණුම් සහ වෙනත් යම් තොරතුරු අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි ආකාරයට සපයන ලෙස අධිකාරියට විධාන කරනු ලැබිය හැකි අතර එම විධාන ක්‍රියාවට නැංවීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

අධිකාරියේ නිලධරයන් සහ අනෙකුත් සේවා නියුක්තයන් රජයේ නිලධරයන් ලෙස සැලකිය යුතු බව.

**30.** අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ නිලධරයන් හා අනෙකුත් සේවා නියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**31.** අධිකාරිය, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතෙහි අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

අනිවාර්ය ඉඩම් අත්කර ගැනීම.

**32.** (1) යම් නම් කළ ප්‍රදේශයක යම් පුද්ගලික ඉඩමක් හෝ පුද්ගලික ඉඩමක යම් සම්බන්ධතාවක් අධිකාරියට එහි යම් කාර්යයක් සඳහා අවශ්‍ය වූ අවස්ථාවක දී හා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම ඉඩම එම කාර්ය සඳහා අත් කර ගැනීම අනුමත කරනු ලැබූ විට, එම ඉඩම හෝ

ඉඩමෙහි සම්බන්ධතාව පොදු කාර්යයක් සඳහා අවශ්‍ය කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන අධිකාරියට පවරාදීම කළ හැකි ය.

(2) අධිකාරිය සඳහා (1) වන උපවගන්තිය යටතේ යම් ඉඩමක් හෝ ඉඩමකට ඇති සම්බන්ධතාවක් අත්කර ගැනීමේ දී වන්දි වශයෙන් ගෙවිය යුතු වන යම් මුදලක් අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩුවක දී, වියදම් අරමුදලෙන් ගෙවිය යුතු බව.

**33.** (1) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ අධිකාරියට එරෙහිව පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දැරිය යුතු වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු වන අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ලැබෙන ගෙවීමක් හෝ අධිකාරිය විසින් කරනු ලබන අයකර ගැනීමක් අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු විසින් මෙම පනතේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ අධිකාරියේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධව එම තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරිපිටට ගෙන එනු ලබන කවර හෝ සිවිල් හෝ අපරාධ නඩුවක දී එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය තීරණය කරන්නේ නම් ඒ සඳහා වන වියදම් එම නඩුවේ දී එම තැනැත්තාට අයකර ගත හැකි නම් මිස, අධිකාරියේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

**34.** (1) අමාත්‍යවරයා විසින්, මෙම පනත මඟින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ නියෝග සාදනු ලැබිය යුතු බවට මේ පනත මඟින් බලය දී ඇති හෝ සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කළ දිනයෙහි හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (අ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් තෙමසක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

**35.** (1) මෙම පනතේ විධිවිධානවලට යටත් ව පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සෑදීමට මණ්ඩලයට හැකි ය:- මණ්ඩලය සතු රීති සෑදීමේ බලය.

(අ) අධිකාරියේ රැස්වීම් හා එම රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය; සහ

(ආ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම හා සම්බන්ධ වෙනත් යම් කාරණා.

(2) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

**36.** (1) (අ) මෙම පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ තම බලතල ක්‍රියාත්මක කරන යම් තැනැත්තකුට යම් යුක්ති සහගත හෝ නීත්‍යානුකූල පදනමකින් තොරව බාධා කරන; වැරදි සහ දණ්ඩන.

(ආ) මෙම පනතෙහි අධිකාරය යටතේ ක්‍රියා කරන තැනැත්තකුව සිටිමින්, මෙම පනත යටතේ යම් බලතලයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී පීඩාකාරී හෝ ප්‍රකෝපකාරී අයුරින් හෝ හැසිරෙන හෝ එවැනි අයුරින් කටයුතු කරන;

(ඇ) මෙම පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් කඩ කරන, හෝ මෙම පනතේ විධිවිධාන යටතේ තමා වෙත දෙන ලද යම් විධානයක් පිළිපැදීමට අපොහොසත් වන; හෝ

(ඈ) මෙම පනත යටතේ තමා වෙත පනවා ඇති යම් නියමයකට අනුකූලව යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ තමා විසින් ඉදිරිපත් කරනු ලබන එවැනි වාර වාර්තාවක හෝ තොරතුරක යම් වැරදි ප්‍රකාශයක් කරනු ලබන,

සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරුවකු කිරීමේ දී රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් මසක් නොඉක්මවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

37. මෙම පනතේ කාර්යය සඳහා -

"සංවර්ධන ව්‍යාපෘතිය" යන්නෙන්, නම් කළ ප්‍රදේශවල නිෂ්පාදන, ආදායම් හෝ රැකියා අවස්ථා උත්පාදනය කරනු ලබන හෝ ආර්ථික, සාමාජීය හෝ පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කරනු ලබන යම් පොදු හෝ පෞද්ගලික ක්‍රියාකාරකමක් අදහස් වේ;

"ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය" යන්නෙන්, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ පිහිටුවන ලද ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය අදහස් වේ;

"වතු" යන්නෙන්, නේවාසික කම්කරුවන් 10 දෙනෙකුට වඩා සිටින්නා වූ ද, අක්කර 20 කට වැඩි ප්‍රදේශයක

තේ, රබර්, පොල් හෝ ඔයිල් පාම් ගස් වගා කොට ඇත්තා වූ ද ඉඩම් ප්‍රදේශ අදහස් වේ;

"ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන" යන්නෙන්, ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ආණ්ඩුවේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය පවරනු ලැබ ඇති ආණ්ඩුවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය" යන්නෙන්, ව්‍යසන කළමනාකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අදහස් වේ;

"නව ගම්මාන" යන්නෙන්, වතුවල පිහිටි පේළි කාමර නිවාස සඳහා තනි නිවාස ආදේශ කරමින් සහ එම වතු ඇතුළත වැඩි දියුණු කරන ලද මූලික යටිතල පහසුකම් සහිතව පිහිටුවනු ලබන ගම්මාන අදහස් වේ;

"වැවිලි ප්‍රජාව" යන්නෙන්, වතුවල ජීවත් වන කම්කරු හා කම්කරු නොවන අයගෙන් සමන්විත නීත්‍යනුකූල පදිංචිකරුවන් අදහස් වේ;

"වැවිලි සමාගම්" යන්නෙන්, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව, 2007 අංක 7 දරන පනතින් පරිච්ඡින්න කොට ආදේශ කරනු ලැබූ 1982 අංක 17 දරන සමාගම් පනතේ 15(1) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකයක් මඟින් සංස්ථාගත කරනු ලැබූවා වූ ද, දෙන ලද කාලසීමාවක් සඳහා, හඳුනා ගත් තේ, රබර් හා පොල්

වතු කළමනාකරණය සඳහා අවස්ථාචෝචිත පරිදි, ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) හෝ 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හෝ සමඟ දීර්ඝ කාලීන බදු ගිවිසුම්වලට එළඹ ඇත්තා වූ ද වැවිලි සමාගම් අදහස් වේ;

"වැවිලි කලාපය" යන්නෙන්, තේ, රබර්, පොල් හෝ ඔයිල් පාම් වගා කරන ලද වතුවල නේවාසික කම්කරුවන් ජීවත් වන්නා වූ, මධ්‍යම, ඌව, සබරගමුව, දකුණු, බස්නාහිර, උතුරු මැද සහ වයඹ පළාත්වලට අයත් දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යටතේ ඇත්තා වූ ප්‍රදේශ අදහස් වේ;

"අදාළ අමාත්‍යවරුන්" යන්නෙන්, වතුවල ඉඩම් උපයෝජනය කිරීම අධීක්ෂණය කිරීමට නීත්‍යානුකූලව බලය පවරනු ලැබ ඇති මුදල් විෂයය භාර අමාත්‍යවරයා, වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා, පොදු ව්‍යවසාය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා සහ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

38. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.